" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**

**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**

OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ISO 9001 | SLAB ACCREDITED | ISO/IEC: 17021 QMS-001-01

Chief Secretary } Telephone : 011 - 2092599 | Fax : 011 - 2092601 | E mail - chiefsecretary@wpc.gov.lk

General Telephone } 011 - 2093000

My No } CSWP/ADM/30-38/FI/01    Your No. }    Date } 2024 .01. 20

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන නීති නිලධාරි,නීති ඒකකය (බ.ප.),
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/පරිපාලන නිලධාරි,

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2024.01.09 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | 2023.12.28<br>රා.ප.චක්‍රලේඛ 3/2020(I) | වැන්දඹු / වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අයකිරීම පිළිබඳ විස්තර පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම. |
| 02. | 2023.12.22<br>රා.ප.චක්‍රලේඛ 26/2023 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධරයන් සඳහා සහනයක් ලබාදීම. |
| 03. | 2023.12.21<br>රා.ප.චක්‍රලේඛ ලිපි 02/2023 | දේපළ ණය ලබාගැනීමට අදාළ තොරතුරු පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම. |
| 04. | 2023.12.21<br>රා.ප.චක්‍රලේඛ 23/2023 | ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතුකොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයින් සඳහා නිවාඩු ලබාදීම. 2023 සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර්. |
| 05. | 2023.12.28<br>රා.ප.චක්‍රලේඛ ලිපි 04/2023 | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 24:3:9 උපවගන්තියට අදාළ වන දඩුවමක් ඇතුළත් විනය නියෝගයකදී වැටුප් වර්ධක අඩුකිරීම ක්‍රියාත්මක කළ යුතු ආකාරය. |

| | | |
|---|---|---|
| 06. | 2023.12.18<br>රා.ප.චක්‍රලේඛ 24/2023 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01" සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2023.12.31 |

02. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එස්.එම්.එච්.කුසුම්සිරි,
පරිපාලන නිලධාරී (පාලන),
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2023

මගේ අංකය : F/FR/03/GBR/Circular
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.12.18

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01." සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2023.12.31</u>**

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක: 01/2015 හා 2015.07.20 දිනැති චක්‍රලේඛයට (මෙය https://www.treasury.gov.lk/api/file/9b53869c-39ec-48b9-a16b-609a0e01a9e5 මඟින් බාගත කළහැකිය ) හා එහි සංශෝධන වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලබන ආදායම් සංකේතාංක 20.02.01.01 වන "රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී" ආදායම් එකතු කිරීමේ වගකීම පැවරී ඇති ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්/ ගණන්දීමේ නිලධාරින් විසින් මු.රෙ.128 (2) (ඇ) විධිවිධාන ප්‍රකාරව එකී ආදායම් සංකේතාංකයට අදාළව හය මසකට වරක් හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

03. එබැවින් 20.02.01.01. වන "රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී" ආදායම් සංකේතාංකය යටතේ නියමිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව නඩත්තු කරන ලද හිඟ ආදායම් සම්බන්ධ ගිණුම් පොත් නිසි පරිදි සංසන්දනය කර ඉහත සඳහන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 පරිදි අමුණා ඇති ආකෘති පත්‍ර අංක 01ට අනුකූලව 2023.12.31 දිනට සකස් කරන ලද හිඟ ආදායම් වාර්තා 2024.01.12 දිනට පෙර "buildingrentpubad@gmail.com" යන විද්‍යුත් තැපැල් ලිපිනයට මෘදු පිටපතක් ද සහිතව මෙම අමාත්‍යාංශයෙහි "ප්‍රධාන මූල්‍ය නිලධාරී" වෙත ඉදිරිපත් කලයුතු අතර අදාළ දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කරමින් හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

04. තවද, එක් එක් වර්ෂයට අදාළ හිඟ ආදායමට අනුරූපීව 2023 වර්ෂය තුල රැස්කරන ලද මුදල් පිළිබඳ විස්තර ද ඊට අමතරව එම කාලච්ඡේදය තුළදී මු.රෙ.113 ට අනුකූලව භාණ්ඩාගාරයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අතහරින ලද හිඟ ආදායම් වේ නම් ඒ සම්බන්ධ විස්තර ද අමුණා ඇති ආකෘති පත්‍ර 02 ට අනුකූලව ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන අංකය :- 0112-056580
ෆැක්ස් අංකය :- 0112- 695723
විද්‍යුත් ලිපිනය:- fin.report.pubad@gmail.com

පිටපත් :- 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

# 2023.12.31 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

I. ව්‍යවස්ථාව /අධිකාරිය - ආයතන සංග්‍රහය / ඉඩම් සංවර්ධන ආඥා පනත / රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 24/2023

II. ව්‍යවස්ථාපිත අධිකාරිය - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

III. ආදායම් අයිතමය - රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී

IV. ආදායම් සංකේතාංකය - 20.02.01.01.

| විස්තරය (රජයේ ගොඩනැගිලි කුලී ආදායම් වර්ගීකරණය) | හිඟ ආදායම් | | | | | හිඟ සඳහා හේතු | හිඟ අයකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග | හිඟ අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020.12.31 දින දක්වා සමුච්චිත හිඟ මුදල | 2021 වසරට අදාල හිඟ මුදල | 2022 වසරට අදාල හිඟ මුදල | 2023 වසරට අදාල හිඟ මුදල | 2023.12.31 දක්වා මුළු හිඟ මුදල (2 +3 + 4 +5) | | | |
| | රු. | රු. | රු. | රු. | රු. | * | * | * |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) |
| i. නිල නිවාස | | | | | | | | |
| ii. සංචාරක බංගලා හා නිවාඩු නිකේතන | | | | | | | | |
| iii. වාණිජ ගොඩනැගිලි/ | | | | | | | | |
| iv. ගබඩා | | | | | | | | |
| v.වෙනත්(ආපනශාලා,ශ්‍රවණාගාර, කුලියට හෝ බද්දට දී ආදායම් ලබන වෙනත් ගොඩනැගිලි ) | | | | | | | | |
| එකතුව | | | | | | | | |

2023.06.30 දිනට ඉදිරිපත් කළ හිඟ ආදායම් වාර්තාව මගින් ඉහත වගුවේ තීරු අංක 2 සිට 4 දක්වා වාර්තා කරන ලද එක් එක් හිඟ මුදල් වලින් 2023 වර්ෂය තුලදී අයවිම් ඇතොත් ඒවා අඩු කළ පසු ලැබෙන මුදලට මෙම තීරු යටතේ වන එකතුන් සමාන විය යුතුවේ. එසේ නැතහොත් අදාල වෙනස්කම් සඳහා විස්තරාත්මක හේතු ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම සුදුසු වේ.

* 7, 8 සහ 9 තීරු සඳහා වලංගු පැහැදිලි හේතුන් අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය. ඒ සඳහා ආකෘතියේ ඇති ඉඩ ප්‍රමාණවත් නොවේ නම් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කිරීම සුදුසුවේ.

සැ.යු. :- හිඟ ආදායම් දැක්වීමේදී ඉහත වර්ගීකරණය යටතේ ඉදිරිපත් කිරීමට සැලකිලිමත් වන්න.

දිනය - …………………………. 

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

…………………......................…......………

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්

(නිල මුද්‍රාව)

ආකෘති පත්‍ර අංක - 02

## 2023.12.31 දිනට හිඟ ආදායම් එකතු කිරීම් පිළිබඳ සහ අනුමත ආදායම් අතහැරීම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව : ආදායම් සංකේතාංක : **20.02.01.01.**

| විස්තරය | 2023 වර්ෂය තුළ හිඟ ආදායම් එකතු කිරීම | | | | * 2023 වර්ෂය තුළ හිඟ ආදායම් අත්හැර දැමීම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2020.12.31 දක්වා | | 2021 | | 2022 | | |
| | 2020.12.31 දින දක්වා හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | 2021 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම | 2022 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම | හිඟ මුදලට අදාලව මුළු එකතු කිරීම් (2+3+4) | හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | හිඟ මුදලට අදාලව අත්හැර දැමීම්වල මුළු එකතුව (6+8+10) |
| | රු. | රු. | රු. | රු. | රු. | | රු. | | රු. | | රු. |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) | (11) | (12) |
| i. නිළ නිවාස | | | | | | | | | | | |
| ii. සංචාරක බංගලා හා නිවාඩු නිකේතන | | | | | | | | | | | |
| iii. වාණිජ ගොඩනැගිලි | | | | | | | | | | | |
| iv. ගබඩා | | | | | | | | | | | |
| iv. වෙනත් (ආපනශාලා,ශ්‍රවණාගාර, කුලියට හෝ බද්දට දී ආදායම් ලබන වෙනත් ගොඩනැගිලි ) | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | |

* මෙම ආදායම් සංකේතාංකය යටතේ වන යම් කිසි ආදායම් අත්හැර දැමීමක් සඳහා මු.රෙ. 113 ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. එබැවින් මේ යටතේ සඳහන් කළ යුත්තේ එසේ භාණ්ඩාගාරයේ (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) අධිකාර බලය ලබාගත් අත්හැර දැමීම් වන අතර ඒ සඳහා අදාල එක් එක් බලය දීමේ ලිපියේ පිටපතක් ද මේ සමඟ ඇමිණිය යුතුවේ.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

දිනය :- ............................ ....................................................................

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්

(නිල මුද්‍රාව)